**සමූපකාර තොග වෙළඳ සංස්ථාව - 2015**

**-----------------------------------------------**

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 12 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 6 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 පෙබරවාරි 23 දින නිකුත් කර ඇත.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය ව්‍යාචනය**

**--------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම

---

සංස්ථාව 2000 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වාම දිගින් දිගටම අලාභ ලැබීම හේතුවෙන් 2013 වර්ෂය අවසානයට රු.7,710,099,424 ක සෘණ අගයක් දක්වා ශුද්ධ වත්කම් හීනවී පැවති අතර 2014 වර්ෂයේ සිදුකළ වත්කම් ප්‍රත්‍යාගණනය හේතුවෙන් ජනිත වු රු.5,780,204,145 ක් වූ අතිරික්තය හේතුවෙන් ශුද්ධ වත්කම්හි සෘණ අගය සමාලෝචිත වර්ෂයේදී රු.2,764,039,908 ක් දක්වා අඩුවිය. කෙසේ වුවද එකතුව රු.4,397,000,000 ක දිගුකාලීන බැඳුම්කර වගකීමක් හා රු.1,929,176,112 ක ජංගම වගකීම් පවතින බැවින් භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බව පෙන්නුම් කෙරේ.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ආරම්භ කරන ලද "ගමට සවිය සතොස බඩිය" ජංගම අලෙවි රථ ව්‍යාපෘතිය සඳහා වෙනම ගිණුම් පවත්වා ව්‍යාපෘතියෙන් වූ සමස්ත බලපෑම හඳුනා ගෙන ගිණුම්ගත කිරීම වෙනුවට සංස්ථාව විසින් අලෙවි රථ වෙත නිකුත් කළ භාණ්ඩවල වටිනාකම හා ඔවුන් විසින් සංස්ථාවට ආපසු භාරදුන් භාණ්ඩවල වටිනාකම අතර වෙනස රු.140,730,116 ක් ආදායම ලෙස හඳුනා ගෙන තිබුණි.

(ආ) වෙළඳ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2006 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.275,000,000 ක ණයමුදල ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, එය ආපසු ගෙවිය යුතු ණය ලෙස දැක්වීම වෙනුවට ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිතයට ඇතුළත් කර තිබුණි.

(ඇ) 1999 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා රු.8,847,374 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ප්‍රමාණය හා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ගෙවිය යුතු විගණන ගාස්තු ගණනය කර එම ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් ලෙස දක්වනු වෙනුවට රු.3,860,592 ක් පමණක් ගෙවිය යුතු විගණන හා බදු උපදේශන ගාස්තු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල අතැති මුදල්හි අන්තර්ගත රු.38,843,286 ක් වූ වටිනාකම සත්‍ය වශයෙන්ම අතැති මුදල් නොවූ අතර, ඒ තුළ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී සංස්ථාවට ලැබිය යුතු ශේෂයන්ද ඇතුළත්ව තිබුණි.

(ඉ) සංස්ථාව විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගත් කෙටිකාලීන ආනයන ණය මුදල වෙනුවෙන් 2014 ජූනි 30 දිනට රු.155,058,221 ක ණය මුදලක්, ඒ සඳහා රු.39,444,946 ක උපචිත දඩ මුදලක් සහ රු.188,975,005 ක උපචිත ණය පොළියක් ගෙවිය යුතුව පවතින බව 2014 සැප්තැම්බර් 03 දිනැති රාජ්‍ය බැංකුවේ කළමණාකරුගේ ලිපියෙන් අනාවරණය වී තිබුණද 2015 වර්ෂයට අදාල ණය මුදල හා පොළිය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

---

සංස්ථාව විසින් වී අලෙවි මණ්ඩලයට ගෙවියයුතු රු.462,589,308 ක් වූ ශේෂයක් පවතින බවට වී අලෙවි මණ්ඩලයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් තහවුරු කර තිබුණද සංස්ථාවේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු අගය ලෙස රු.285,644,838 ක් දක්වා තිබුණි. බදු කුලී, සහල් ව්‍යාපෘතියෙන් හා වෙනත් වශයෙන් සංස්ථාවට වී අලෙවි මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල රු.71,454,575 ක් ලෙස සංස්ථාවේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සංස්ථාව වෙත ගෙවිය යුතු වටිනාකම වශයෙන් කිසිදු මුදලක් දක්වා නොතිබුණි. මෙම වෙනස්කම් නිරවුල් කරගැනීම සඳහා 2017 මාර්තු 20 වන විටත් කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

---

පහත සඳහන් ගණුදෙනු සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.497,545,836 ක් වූ ජංගම වත්කම් ගිණුම් ශේෂ 7 ක්, එකතුව රු.9,959,816,324 ක් වූ ජංගම හා ජංගම නොවන වගකීම් ගිණුම් ශේෂ 6 ක් එකතුව රු.56,868,334 ක් වූ ආදායම් ගිණුම් ශේෂ 2 ක් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම්, විස්තරාත්මක උපලේඛන, තොග සත්‍යාපන වාර්තා නොමැතිවීම.

(ආ) සමූහයේ අනෙකුත් සමාගම් වලට අදාලව සමාලෝචිත වර්ෂයේ ගිණුම්වල දක්වන ලද රු.116,964,293 ක් වූ ආදායම්, රු.111,675,694 ක් වූ වියදම් සහ 2015 දෙසැම්බර් 31 දිනට පැවති රු.16,020,571 ක් වූ ජංගම නොවන වත්කම්, රු.85,775,325 ක් වූ ජංගම වත්කම්, රු.54,740,686 ක් වූ හිමිකම්, රු.47,055,209 ක් වූ ජංගම වගකීම් සනාථ කරගත හැකි වන ආකාරයේ තොරතුරු හා උපලේඛන.

(ඇ) ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු වටිනාකම් ලෙස දැක්වෙන එකතුව රු.183,602,957 ක් වූ ගිණුම් ශේෂ 17 ක් නිශ්චිතව හඳුනාගැනීමට අදාල තොරතුරු.

(ඈ) සංස්ථාව විසින් රාජ්‍ය බැංකුවකින් ලබාගත් කෙටිකාලීන ණය මුදලට අදාලව 2015 වර්ෂයට අදාල පොළිය හා ණය මුදල් විස්තර ඉදිරිපත් නොවුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබියයුතු වටිනාකම රු.870,963,097 ක් වූ අතර එයින් රු.389,467,293 ක් හෙවත් සියයට 45 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් නොගෙන හානිකරණය සඳහා වෙන්කිරීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව වී අලෙවි මණ්ඩලයට සහල් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු වටිනාකම රු.274,121,687 ක් වූ අතර වී අලෙවි මණ්ඩලයෙන් බදු කුලී, වෙනත් වශයෙන් සංස්ථාවට ලැබිය යුතු මුදල රු.72,986,018 ක් විය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1991 අංක 31 දරන සමුපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධන) පනතේ 2.2 (අ) වගන්තිය අනුව සංස්ථාවේ මුදල් ආයෝජනය කළ හැක්කේ පවත්නා පොදු සමාගම්වල පමණක් වුවද ඊට පටහැනිව රු.10 ක කොටසක නාමික ආයෝජනයක් සිදුකර “සී/ස සතොස ආර්ථික මධ්‍යස්ථාන සේවා පෞද්ගලික සමාගම” හා “ සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම”නමින් රාජ්‍ය සමාගම් 02 ක් ස්ථාපිත කර සංස්ථාවෙන් වැටුප් ලබන නිළධාරීන් 04 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

සංස්ථාව විසින් නිසි අනුමැතියකින් තොරව ණය පදනම මත ඉකුත් වර්ෂ දෙකකදී රු.8,660,782 ක ටින් මාළු අලෙවි කර තිබුණි. එයින් රු.4,362,320 ක් 2016 අගෝස්තු 20 දින වන විටත් අය කර ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.541,087,014 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.310,874,332 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.230,212,682 කින් වැඩිවී තිබුණි. වී සහල් කිරීමේ ව්‍යාපෘතියෙන් ලද ආදායම අහිමිවීම, අනෙකුත් මෙහෙයුම් ආදායම් රු. 112,632,358 කින් අඩුවීම, පරිපාලන වියදම් රු.52,034,040 කින් ඉහළ යාම ඉහත ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.313,605,785 ක ඌනතාවය උච්ඡාවචනයන් සහිතව 2015 වර්ෂයේදී රු.541,087,014 ක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික, බදු හා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.186,511,684 ක සෘණ අගයක් ගෙන තිබූ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2015 වර්ෂයේදී රු.177,526,282 ක සෘණ අගයක් ගෙන තිබුණි.

**3.2 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන 08 ක් හා පුද්ගලයින් 20 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට සංස්ථාවට එරෙහිව රු.35,815,071 ක වන්දි ඉල්ලා නඩු 46 ක් පවරා ඇති අතර සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුල රු.904,187 ක වන්දි මුදලක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාව විසින් ආයතන 06 කට හා පුද්ගලයින් 04 දෙනෙකුට එරෙහිව රු.82,781,016 ක මුදලක් ඉල්ලා නඩු 10 ක් පවරා ඇති අතර එමගින් රු.21,034,413 ක මුදලක් අයකර ගෙන තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

සංස්ථාවේ 2015 වර්ෂයේ කාර්යය සාධන වාර්තාවේ දක්වන පරිදි සංස්ථාවේ අරමුණු හා කාර්යයන් පහත පරිදි විය.

(i) රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත අත්‍යාවශ්‍ය කළමනා සැපයීම.

(ii) පොදු මහජනතාව වෙත තොග හා සිල්ලරට භාණ්ඩ සැපයීම.

(iii) කාර්යක්ෂමව හා සඵලදායී ලෙස මානව හා අනෙකුත් සම්පත් ප්‍රයෝජනයට ගැනීම.

(iv) ආයතනයේ පැවතීම සඳහා ප්‍රමාණවත් අරමුදල් උත්පාදනය/ ප්‍රභවය කර ගැනීම.

(v) නවතාවයකින් යුතු භාණ්ඩ උත්පාදනය/ ප්‍රභවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම.

ඉහත අරමුණු අතරින් "නවතාවයකින් යුතු භාණ්ඩ උත්පාදනය/ ප්‍රභවය සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම" කෙරෙහි 2015 වර්ෂයේදී අවධානය යොමු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු අලෙවිසැල් හා ගබඩා ගොඩනැගිලි 32 ක් රාජ්‍ය සමාගමක් වන සී/ස ලංකා සතොස සමාගමට කුලී පදනම මත පවරා දී තිබුණු අතර, ගොඩනැගිලි කුලිය සම්බන්ධයෙන් රජයේ තක්සේරුකරුගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව විසින් තක්සේරු වටිනාකම රු.54,722,228 ක් වූ වත්කම් සී/ස ලංකා සතොස සමාගමට පවරාදී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ විධිමත් එකඟතාවයකට 2016 අගෝස්තු 31 දින වන විටත් එළඹ නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් 1999 වර්ෂයේදී පෞද්ගලික සමාගමක රු.9,923,710 ක් ආයෝජනය කර තිබුණද එම සමාගම දිගින් දිගටම පාඩු ලැබීම මත 1999 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කිසිදු ලාභාංශ මුදලක් ලැබී නොතිබුණි.

(ඈ) සංස්ථාව විසින් 2002 වර්ෂයේදී සතොස සිල්ලර සමාගමේ රු.171,928,690 ක් ආයෝජනය කර තිබුණද කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි. අධිකරණ නියෝගයකට අනුව 2007 වර්ෂයේදී ඈවරකරුවෙකු පත් කර තිබූ අතර 2013 වර්ෂයේදී ඈවර කටයුතු අවසන්ව තිබුණි. මෙම ආයෝජන වටිනාකම හානිකරණය සඳහා වෙන්කිරීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**4.3** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පාසලක ඉදිකිරීම් කටයුතු සඳහා මහපොළ භාරකාර අරමුදලෙන් හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම වෙත ලබාදිය යුතු මුදල් සංස්ථාව හරහා ලබාදී තිබූ අතර මෙම රාජ්‍ය ආයතන අතර ඇතිවන ගණුදෙනු සඳහා සංස්ථාව මැදිහත් වීමට හේතු පැහැදිලි නොවුණි. මෙම ඉදිකිරීම් සඳහා සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු සමාගම වෙත සංස්ථාව විසින් රු.26,285,661 ක ණය මුදල් ලබාදී තිබූ අතර එම ණය කාලපරිච්ඡේදය වෙනුවෙන් සංස්ථාව කිසිදු ප්‍රතිලාභයක් ලබා නොතිබුණි.

**4.4** **ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී සංස්ථාව විසින් ගණකාධිකාරීවරුන් හතර දෙනෙකුගේ සේවය ලබාගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.3,244,869 ක් ගෙවීම් කර තිබියදීත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා රු.2,193,980 ක් වරලත් ගණකාධිකාරී සමාගමකට ගෙවීම් කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පස් අවුරුදු ව්‍යාපාරික සැලැස්මක් ඇතිව ලොරි රථ 100 ක් යොදා ගනිමින් 2014 දෙසැම්බර් 04 දින ආරම්භ කරන ලද "ගමට සවිය, සතොස බඩිය" ව්‍යාපෘතිය 2015 ජනවාරි මාසයෙන් පසුව අක්‍රීය තත්ත්වයකට පත්ව තිබූ අතර 2016 මාර්තු 03 දින වන විට සංස්ථාව එම ව්‍යාපෘතියෙන් ලැබූ අලාභය රු.65,859,217 ක් විය. ව්‍යාපෘතිය අක්‍රීය තත්ත්වයට පත්ව තිබුණද 2016 අගෝස්තු 31 දින වන විටත් ව්‍යාපෘති සහකරුවන් භාරයේ පවතින ලොරි රථ 15 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5** **හඳුනාගන්නා ලද පාඩු**

සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනවලදී ගෙවීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස දෙකකට අදාලව රු.66,044 ක් අධිභාර වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

**4.6** **ප්‍රතිව්‍යුහගත කිරිමේ ගනුදෙනු**

2003 වර්ෂයේදී සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ වී තිබුණු අතර, 2003 දෙසැම්බර් 01 දිනට වාණිජ බැංකු 6 කට ගෙවිය යුතුව තිබුණු රු. 5,493,000,000 ක් වූ ණය මුදලින් රු. 4,397,000,000 ක් ගෙවා නිරවුල් කිරීමට වාණිජ බැංකු එකඟ කරවාගෙන ඒ වෙනුවෙන් වසර 13 කින් කල්පිරෙන භාණ්ඩාගාර බැඳුම්කර අදාළ වාණිජ බැංකු වෙත නිකුත් කර තිබුණි.

ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල වන රු. 4,397,000,000 ක සහ භාණ්ඩාගාරය විසින් සතොස රිටේල් සමාගමේ ණයහිමියන් හා වාණිජ බැංකු 03 කට ගෙවන ලද රු. 200,000,000 ඇතුලුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුළු වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල රු. 4,597,000,000 ක් දක්වා තිබුණි.

මීට අදාළව සමාලෝචිත වර්ෂය අවසාන දිනට භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.3,453,793,134 ක් වූ බැඳුම්කර පොළී වගකීම " සතොස බැඳුම්කර සඳහා ගෙවිය යුතු පොලිය "නමින් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි.

තවද මෙම ගෙවිය යුතු රු. 4,597,000,000 න් රු. 200,000,000 ක් භාණ්ඩාගාරය වෙත ලැබිය යුතු වටිනාකමක්ද යන්න භාණ්ඩාගාරය වෙතින් තහවුරු කරවා ගැනීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණු අතර අනෙකුත් ණයහිමියන් යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම් ලෙස රු.66,363,460 ක් දැක්වීමෙන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ගනුදෙනුව නිසි පරිදි හෙළිදරව් කර හෝ ගැලපීම් කර නොමැති බැව් පැහැදිලි වේ. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ අගය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල පොත් තැබීම් ලෙස දක්වා තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය කළමණාකරණ ශ්‍රේණියේ තනතුරු 20 කින්ද, කළමණාකරණ සහකාර මට්ටමේ තනතුරු 51 කින්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 245 ක්ද වශයෙන් මුළු තනතුරු 316 කින් සමන්විත වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අතිරික්ත සේවක සංඛ්‍යාව 104 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් විය.

(ආ) 2012 වර්ෂය තුළ බඳවාගත් නිලධාරියෙකුට එක් වර්ෂයක වැටුප් වර්ධක 3 ක් හා තවත් වර්ෂයක වැටුප් වර්ධක 2 බැගින් පිරිනැමීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.159,390 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එසේ 2012 වර්ෂයේ සිට 2016 මාර්තු 01 වන විට වැඩිපුර ගෙවූ ප්‍රමාණය රු.589,490 ක් වී තිබුණි.

(ඇ) සංස්ථාව ස්ථාපිත පනතේ විධිවිධාන සලසා හෝ වෙනත් නීතියකින් ප්‍රතිපාදන සලසා නොතිබුණු හා සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2011 වර්ෂයේදී බඳවා ගැනීම් සිදුකර තිබූ අතර 2011 වර්ෂයේ සිට 2016 මාර්තු 31 දින දක්වා රු.5,781,732 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

-----------------------------------------------------------

සතොස ආයතනයේ නිලධාරීන් 06 දෙනකු සංස්ථාවේ උප සමාගම්වල හා සමුපකාර සමිතියක සේවය සඳහා අනුයුක්ත කර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී රු. 1,526,400 ක මුදලක් වැටුප් හා වෙනත් පාරිශ්‍රමික වශයෙන් ගෙවා තිබුණු අතර එම මුදල අදාළ ආයතනවලින් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත 2016 මැයි 09 වන දින ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

**5.2 සංයුක්ත සැලැස්ම**

-------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ දැක්ම හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද එය කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණද එහි මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ණය ආපසු ගෙවීමේ සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්වල ප්‍රගතිය පරීක්ෂා කල හැකි ප්‍රගති වාර්තා හා තොරතුරු විගණනය වෙත ලැබී නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

----------------------

අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර තිබුණද ප්‍රමාණවත් සහායක කාර්යමණ්ඩලයක් පත්කර නොතිබුණෙන් සමාලෝචිත වර්ෂය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සංස්ථාව තුල සිදුකර නොතිබුණු අතර කිසිදු අභ්‍යන්තර විගණන විමසුමක් හෝ වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

------------------------------

ඇස්තමේන්තුගත ආදායම හා වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 15 සිට සියයට 917 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

-----------------------------

නොවිසඳී ඇති විගණන ඡේද පහත දැක්වේ.

| | විගණන වාර්තාවේ යොමුව | ඡේදය |
|---|---|---|
| (අ) | 2011- 4.2 ඡේදය | වටිනාකම රු.5,097,445 ක් වූ "බහළුම් යන්ත්‍ර" 12 හි විදුලි මෝටර් අස්ථාන ගතවීම. |
| (ආ) | 2011- 4.8 ඡේදය | 2006 සැප්තැම්බර් මාසයේදී සංස්ථාව විසින් ආනයනය කරන ලද රු.14,501,998 ක් වූ සහල් සැකසීම් යන්ත්‍ර 140 ක් 2016 සැප්තැම්බර් 13 වන විටත් සංස්ථාව තුල නිෂ්ක්‍රීයව පැවතීම. |
| (ඇ) | 2012 -2.2.3(ඉ) | 2011වර්ෂය වෙනුවෙන් වාර්ෂික බදු කුලී හා රටබීම බලපත්‍ර ගාස්තු වශයෙන් ලංකා සතොස සමාගමෙන් ලැබිය යුතු රු.71,561,640 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට හෝ ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ඈ) | 2012 - 4.3 (ආ) | කුලී පදනම මත ලබාගත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ගබඩා 02 ක ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රු.78,978,504 ක වියදමක් වැය කර සංස්ථාව විසින් වී මෝල් ඉදිකර තිබීම. |
| (ඉ) | 2012 - 2.2.3(ඇ) | වාහන විකුණුම් ලාභය රු.5,101,356 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.5,892,489 ක් ලෙස දක්වා තිබීම නිසා වාහන විකුණුම් ලාභය රු.791,133 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම. |
| (ඊ) | 2012 - 2.2.4(අ) | සමාලෝචිත වර්ෂයේ ශේෂ පිරික්සුම පරීක්ෂා කිරීමේදී වත්කම් හා වියදම් ගිණුම් 168 ක එකතුව රු.27,584,061,602 ක් වූ හර ශේෂයන්ද වගකීම් හා ආදායම් ගිණුම් 110 ක එකතුව රු.30,129,471,178 ක් වූ බැර ශේෂයන් ද මූල්‍ය ප්‍රකාශන සමග එකඟ නොවීම. |
| (උ) | 2012 - 2.2.4(ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ ටීආර් ණය මහජන බැංකුව නමින් රු.207,050,943 ක කෙටිකාලීන ණයක් දක්වා තිබූ නමුත් බැංකුව විසින් එවන ලද ශේෂ තහවුරු කිරීමේ ලිපිය පරිදි එම ණය ශේෂය රු.207,097,942 ක් වීම. |
| (ඌ) | 2012 - 2.2.5(අ) | 2012 දෙසැම්බර් 31 දින දක්වා ඇසුරුම් අංශය වෙත ලැබී තිබුණු මුළු සුදු සීනි ප්‍රමාණය සම්බන්ධයෙන් කි.ග්‍රෑ.15,000 ක ප්‍රමාණයකට අදාලව රු.18,450 ක ගාස්තුවක වෙනසක් සහ පැකට් 23,514 ක් හෝ කි.ග්‍රෑ.170,119 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය අඩුමානයට අදාල ආදායම් අහිමිවීමේ අවදානම පිළිබඳව කළමනාකාරිත්වය මෙතෙක් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම. |
| (එ) | 2013 - 2.2.3 (අ)iii | ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී ගිණුම් ශේෂ 03 ක රු.299,798,933 ක් වූ වෙනසක් අනාවරණය වීම. |

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ලෙජර ගිණුම් සඳහා කේත අංක භාවිතා නොකිරීම.<br>(ii) ජ'නල් වවුචර සඳහා සංලක්ෂයන් නිවැරදිව භාවිතා නොකිරීම.<br>(iii) වවුචරයට අදාල උපකාරක ලියවිලි නිසි පරිදි වවුචර සමඟ අමුණා නොතිබීම. |
| (ආ) තොග පාලනය | වාර්ෂිකව භෞතික තොග සමීක්ෂණයන් සිදු නොකිරීම හා වර්තමාන තොග වටිනාකම හඳුනා නොගැනීම. |
| (ඇ) බදුකුලී ආදායම් අයකර ගැනීම | හිඟහිටි බදුකුලී අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර නොගැනීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු නොපිරවීම. |
| (ඉ) නීති කටයුතු | ගිවිසුම් වලට එළඹීමේදී අනුක්‍රමික අංක භාවිතා කිරීම සිදු නොවන බැවින් සංස්ථාව විසින් බාහිර පාර්ශවයන් සමග එළඹෙන ගිවිසුම් සංඛ්‍යාව හඳුනාගත නොහැකි වීම. |